දුරකථන/ தொலைபேசி/Telephones:
කොම්ප්ට්‍රොලර් ජනරාල්
கொம்ப்ரோலர் ஜெனரல்
Comptroller General
0112151425
පොදු
பொது
General
0112484600
වෙබ් අඩවිය
இணையத்தளம்
Website
ඊමේල්
தொலைநகல்
E-Mail
cgo@mo.treasury.gov.lk

# කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය
## මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# கொம்ப்ரோலர் ஜெனரல் அலுவலகம்
## நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# Comptroller General's Office
## Ministry of Finance and Mass Media

මහලේකම් කාර්යාලය, කොළඹ 01
செயலகம் , கொழும்பு 01
The Secretariat, Colombo 01
ෆැක්ස්
தொலைநகல்
Fax
0112151417

මගේ අංකය
எனது இல.
My No
CGO/ASM/Rev//01

ඔබේ අංකය
உமது இல.
Your No

දිනය
திகதி
Date
2018.06. 25

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

**2017.06.30 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම**

රාජ්‍ය ආදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම, අධීක්ෂණය හා වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශයන් ඇතුලත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරන ලද අංක 01/2015 හා 2015.07.20 දිනැති චක්‍රලේඛය සහ ඒ සඳහා කරනු ලැබූ සංශෝධන ඇතුලත් 2016.12.30 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015(V) සහ 2018.01.01 දින සිට ප්‍රාග්ධන වත්කම් විකිණීමේ ආදායම් ගිණුම් තැබීම් කටයුතු කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත පැවරීම සම්බන්ධයෙන් නිකුත් කළ අංක 01/2015(XII) හා 2018.03.22 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය පිළිබඳව ඔබගේ අවධානය යොමු කරවමි.

02. ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරීන් විසින් මු.රෙ.128 (2) (ඇ) විධිවිධාන ප්‍රකාරව තම වගකීම් යටතේ පවතින ආදායම් සංකේතාංකවලට අදාලව අර්ධ වාර්ෂිකව හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.කොම්ප්ට්‍රොලර් ජනරාල් ගණන්දීමේ නිලධාරියා ලෙස කටයුතු කරනු ලබන පහත සඳහන් ආදායම් සංකේතාංක යටතේ එකතු කරන ආදායම් පිළිබඳව අදාල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්/ගණන්දීමේ නිලධාරීන් විසින් අර්ධ වාර්ෂිකව ඉදිරිපත් කරනු ලබන තොරතුරු ඒකාබද්ධ කිරීමෙන් හිඟ ආදායම් වාර්තා සකස් කර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

| ආදායම් සංකේතාංකය | විස්තරය |
| --- | --- |
| 20.06.02.01 | ප්‍රාග්ධන වත්කම් විකිණීම - වාහන |
| 20.06.02.02 | ප්‍රාග්ධන වත්කම් විකිණීම - වෙනත් |

03. ඉහත 2 හි දැක්වෙන එක් එක් ආදායම් සංකේතාංක යටතේ නියමිත නීති සහ රෙගුලාසි ප්‍රකාරව නඩත්තු කරන ලද ආදායම් සංකේතාංක සඳහා වන හිඟ ආදායම් සම්බන්ධව ගිණුම් වාර්තා පොත් යනාදිය නිසි පරිදි සංසන්දනය කර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 සඳහන් පරිදි අමුණා ඇති CGO/REVARE/01 ආකෘති පත්‍රය අනුව 2018.06.30 දිනට සකස් කරන ලද හිඟ ආදායම් වාර්තා 2018.07.10 දිනට පෙර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.අදාල දිනට හිඟ ආදායම් කිසිවක් නොමැති නම් ඒ බව සඳහන් කර හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

04. එක් එක් වර්ෂයට අදාල හිඟ ආදායමට අනුරූපීව 2018 වර්ෂයේ මුල් හය මාසය තුලදී අයකරන ලද මුදල් පිළිබඳ විස්තර ද එම කාලපරිච්ඡේදය තුලදී මු.රෙ.113 පරිදි භාණ්ඩාගාරයෙන් ලද අනුමැතිය ප්‍රකාරව අතහරින ලද එක් එක් ආදායම් වේ නම් ඒ පිළිබඳ විස්තර ද අමුණා ඇති CGO/REVARE/02 ආකෘති පත්‍රයේ සඳහන් කර ඉදිරිපත් කළ යුතුය.

05. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015(V) ප්‍රකාරව ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ විස්තරාත්මක වාර්තා ඔබ විසින් නිසි පරිදි පවත්වා ගත යුතු බවද සඳහන් කරමි.

පී.බී.එස්.සී.නෝනිස්
කොම්ප්ට්‍රොලර් ජනරාල්

පිටපත් :- 1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආකෘති පත්‍ර අංක (CGO/REVARE/01)

## 2018.06.30 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව

(i) ව්‍යවස්ථාපිත අධිකාරිය :- (අදාල අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)............
(ii) ආදායම් අයිතමය :- ..................................................
(iii) ආදායම් සංකේතාංකය :- ..................................................

| විස්තරය | හිඟ ආදායම් | | | | | හිඟ සඳහා හේතු | හිඟ අයකර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග | හිඟ අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ සහතිකය |
|---|---|---|---|---|---|---|---|---|
| | 2015.12.31 දක්වා සමුච්චිත හිඟ මුදල (රු) | 2016 වසරට අදාල හිඟ මුදල (රු) | 2017 වසරට අදාල හිඟ මුදල (රු) | 2018.06.30 දිනට අදාල හිඟ මුදල (රු) | 2018.06.30 දක්වා මුළු හිඟ මුදල (2+3+4+5) (රු) | * | * | * |
| (1) | (2) | (3) | (4) | (5). | (6) | (7) | (8) | (9) |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

2017.12.31 දිනට ඉදිරිපත් කල හිඟ ආදායම් වාර්තාව මගින් ඉහත වගුවේ තීරු අංක 2 සිට 4 දක්වා වාර්තා කරන ලද එක් එක් හිඟ මුදල් වලින් 2018 වර්ෂයේ මුල් මාස 6 දක්වා වන අයවීම් ඇතොත් ඒවා අඩුකල පසු ලැබෙන මුදලට මෙම තීරු යටතේ වන එකතුන් සමාන විය යුතු වේ. එසේ නැතහොත් අදාල වෙනස්කම් සඳහා විස්තරාත්මක හේතු ඇමුණුම් ලෙස ඉදිරිපත් කළ යුතුය.

* 7 හා 8 සහ 9 තීරු සඳහා වලංගු හේතූන් අනිවාර්යයෙන්ම සඳහන් කල යුතුය

**සකස් කලේ :** ..........................................

**පරීක්ෂා කලේ :** ..........................................
**ප්‍ර.මූ.නි/අධ්‍යක්ෂ (මුදල්)/ප්‍ර.ගණකාධිකාරී/ගණකාධිකාරී**

**ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.**

..................................................................
**ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්**

**(නිල මුද්‍රාව)**

දිනය :- ........................

ආකෘති පත්‍ර අංක **(CGO/REVARE/02)**

## 2018.06.30 දිනට හිඟ ආදායම් එකතු කිරීම පිළිබඳ සහ අනුමත ආදායම් අතහැරීම පිළිබඳ ප්‍රකාශය

අදාල අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/දිස්ත්‍රික් ලේකම් කාර්යාලය : ආදායම් සංකේතාංකය :

| විස්තරය | 2018 වර්ෂය තුල හිඟ ආදායම් එකතු කිරීම | | | | 2018 මුල් මාස හය තුල හිඟ ආදායම් අත්හැර දැමීම | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2015.12.31 දක්වා | | 2016 | | 2017 | | |
| | 2015.12.31 දින දක්වා හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් | 2016 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් | 2017 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් | හිඟ මුදලට අදාලව මුළු එකතු කිරීම් (2+3+4) | අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපියොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපියොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපියොමුව සහ දිනය | හිඟ මුදලට අදාලව අත්හැර දැමීම් වල මුළු එකතුව (6+8+10) |
| | (රු) | (රු) | (රු) | (රු) | (රු) | | (රු) | | (රු) | | (රු) |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) | (10) | (11) | (12) |
| | | | | | | | | | | | |

එක් එක් ආදායම් සංකේතාංක යටතේ වන යම්කිසි ආදායම් අත්හැර දැමීමක් සඳහා මු.රෙ. 113 ප්‍රකාරව භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබාගතයුතු වේ. එබැවින් මේ යටතේ සඳහන් කල යුත්තේ එසේ භාණ්ඩාගාරයේ (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ) අධිකාර බලය ලබාගත් අත්හැර දැමීම් වන අතර ඒ සඳහා අදාල එක් එක් බලය දීමේ ලිපියේ පිටපතක් ද මේ සමඟ ඇමිණිය යුතු වේ.

**සකස් කලේ :** ..........................................

**පරීක්ෂා කලේ :** ..........................................

**ප්‍ර.මු.නි/අධ්‍යක්ෂ (මුදල්)/ප්‍ර.ගණකාධිකාරී/ගණකාධිකාරී**

**ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.**

..........................................................................

**ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්**

**(නිල මුද්‍රාව)**

**දිනය :-**